# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 41 දරන
# බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ඔක්තෝබර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1987 අංක 41 දරන බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත**

**[සහතිකය සටහන් කළේ 1987 ඔක්තෝබර් මස 23 වන දින.]**

**එල්. ඩී.-ඕ. 59/85**

**බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක්, ඒ භාරයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා මුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා, මේ දක්වා බලංගොඩ පිහිටුවා ඇති හෙයින් ද: පූර්විකාව.

එකී භාරයේ කටයුතු සහ පරමාර්ථ භාරකාර මණ්ඩලයක් විසින් මේ දක්වා ඉටු කරනු ලැබ, සහ ක්‍රියාත්මක කරනු ලැබ ඇති හෙයින් ද:

සංස්ථාගත කරන ලෙස එකී භාරකාර මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති හෙයින් හා එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 41 දරන බලංගොඩ ලලිත් ඇතුලත් මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලඝු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලයේ තත්කාලයේ සාමාජිකයන්, (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "බලංගොඩ ලලිත් ඇතුලත්මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද ඒ සංස්ථා නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පැවරීම කළ හැකි වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. බලංගොඩ ලලිත් ඇතුලත් මුදලි අධ්‍යාපනික භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අධ්‍යාපන කටයුතු නංවාලීම;

(ආ) ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය පරපුරේ පොදු ශුභ සාධනය නංවාලීම;

(ඇ) ආර්ථික හේතු නිසා උසස් අධ්‍යාපනයෙහි නියැලීමට නොහැකි බලංගොඩ සහ ඉඹුල්පෙ උපදිසාපති කොට්ඨාසවල ස්ථිර පදිංචිය දරන ශිෂ්‍යයන්ට මූල්‍ය ආධාර සැලසීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඇ) බලංගොඩ සහ ඉඹුල්පෙ උපදිසාපති කොට්ඨාසවල ජාතික කලා හා ශිල්ප නංවාලීමට ප්‍රමුඛස්ථානය දෙමින් ජාතික කලා හා ශිල්ප නංවාලීම සහ වැඩිදියුණු කිරීම ;

(ඉ) ශිෂ්‍යයන් අතර ක්‍රීඩා කටයුතු පිළිබඳ උනන්දුවක් ඇති කිරීම ;

(ඊ) සියලු ආගමික කණ්ඩායම් අතර සුහදතාව සහ සමගිය වර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, සියලු ආගමික කණ්ඩායම්වල සංවර්ධන කටයුතුවලට සහාය වීම ; සහ

(උ) බලංගොඩ සහ ඉඹුල්පෙ උපදිසාපති කොට්ඨාසවල ශිෂ්‍යයන්ට යහපතක් සැලසෙන්නේ යයි භාරකාර මණ්ඩලයේ මතය වන් වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

භාරකාර මණ්ඩලයේ සංයුතිය.

4. (1) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් වෙත භාරයේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පවරනු ලැබිය යුතු ය :—

(අ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන රත්නපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, ඒ මන්ත්‍රීවරයාගේ කැමැත්ත ඇතිව ;

(ආ) බලංගොඩ පරිපාලන කොට්ඨාසයේ උපදිසාපතිවරයා, ඒ උපදිසාපතිවරයාගේ කැමැත්ත ඇතිව ;

(ඇ) ඉඹුල්පෙ පරිපාලන කොට්ඨාසයේ උපදිසාපතිවරයා, ඒ උපදිසාපතිවරයාගේ කැමැත්ත ඇතිව ;

(ඈ) බලංගොඩ උතුර හා දකුණ මණ්ඩල භාර මාණ්ඩලික අධ්‍යාපන නිලධරයන්, ඒ මාණ්ඩලික අධ්‍යාපන නිලධරයන්ගේ කැමැත්ත ඇතිව ;

(ඉ) බලංගොඩ සහ ඉඹුල්පෙ උපදිසාපති කොට්ඨාසවල දෙමළ හා මුස්ලිම් පාසල් භාර මාණ්ඩලික අධ්‍යාපන නිලධරයා, ඒ මාණ්ඩලික අධ්‍යාපන නිලධරයාගේ කැමැත්ත ඇතිව ;

(ඊ) බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා, ඒ නගර සභාවේ සභාපතිවරයාගේ කැමැත්ත ඇතිව ; සහ

(උ) විවිධ සේවා සමුපකාර සමිතිවල නියෝජිතයන් වූ ද, බලංගොඩ සහ ඉඹුල්පේ උපදිසාපති කොට්ඨාසවල නිත්‍ය පදිංචිකරුවන් වූ ද තැනැත්තන් අතුරෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නම් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර බලංගොඩ පරිපාලන කොට්ඨාසයේ උපදිසාපතිවරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ නම් කරනු ලැබූ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් මිස, තමන් නම් කරනු ලැබූ දින සිට වර්ෂ දෙකක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත නම් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කර්තව්‍යයක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

(5) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ ධුර දැරූ භාරයේ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය විය යුතු අතර මේ පනත යටතේ අළුතින් මණ්ඩලයක් පත් කරනු ලබන තෙක් ඒ මණ්ඩලය විසින් කටයුතු කරගෙන යනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

මණ්ඩලයේ බලතල කාර්ය සහ කර්තව්‍ය.

5. (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, භාරයේ නාමයෙන්, භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික හෝ සියලු දේවල් කිරීමේ බලය මණ්ඩලයට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකි ය :—

(අ) මේ පනත මගින් හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ පරිත්‍යාග කිරීමක් මගින් හෝ අන්‍ය ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පවරාදීම, පරිත්‍යාග කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියෝජනය කිරීම ;

(ඇ) භාරයේ අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඈ) අරමුදලේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ භාරයේ දේපළ ඇපයට තබා හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඉ) අරමුදල් එකතු කිරීම සහ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම ; තවද,

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට ආනුෂංගික වන හෝ හිතකර වන අනෙකුත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

භාරයේ අරමුදල.

6. (1) භාරයේ අරමුදල—

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙරාතුවම වූ දින යේදී අරමුදලේ බැරට පැවති සියලු මුදල්වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු සංස්ථාවට එකතු වන සියලු මුදල්වලින්

සමන්විත විය යුතු ය.

(2) අරමුදලේ බැරට ඇති සියලු මුදල්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා වැයවන වියදම් පියවීම පිණිස යොදවනු ලැබිය යුතු ය.

අරමුදලින් ගෙවිය යුතු සහ අරමුදලට ලැබිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි භාරයේ පැවති සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර භාරයට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එය වෙනස් කරනු ලැබිය හැකි ය. තව ද මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස මණ්ඩලයේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණි සිටි බවට සලකුණක් වශයෙන් එකී සාමාජිකයන් විසින් එම සාධන පත්‍රයෙහි නම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ රීති.

9. (1) මණ්ඩලය විසින් කලින් කල, මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීමක දී ඊට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත සඳහන් කාරණා සියල්ලම සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි ය :—

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ 3(ඇ) වන වගන්තියේ සඳහන් ශිෂ්‍යයන්ට මුදල් ආධාරදීම ;

(ආ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් දරනු ලැබූ වියදම් පියවීම;

(ඈ) භාරයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම;

(ඉ) භාරයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යෑම සහ ඒවා විගණනය කිරීම;

(ඊ) ගිණුම් තැබීම, මුදල් තැන්පත් කිරීම සහ ලේඛනවල භාර කාරත්වය; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ වන හෝ ආනුෂංගික වෙනත් යම් කරුණක්.

එවැනි රීති සාදනු ලැබීමෙන් පසු ඒවා එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අළුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයෝ තත් කාලයේ භාරයේ බල පවත්නා රීතිවලට යටත්විය යුත්තාහ.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.